# දක්ෂිණ අධිවේගී මාර්ගය

E01





මාර්ග සංවර්ධන අධිකාරිය

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය

# පටුන


| | | |
|---|---|---|
| 1. | **හැඳින්වීම** | 01 |
| 2. | **සිතියම** | 02 |
| 3. | **මාර්ගයට ප්‍රවේශවිය හැකි ස්ථාන** | 03 |

- **අන්තර් හුවමාරු**

| | | | | |
|---|---|---|---|---|
| I. | කොට්ටාව | (කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගය) | (A004) | 03 - 05 |
| II. | කහතුඩුව | (කොළඹ - හොරණ මාර්ගය) | (B084) | 06 - 07 |
| III. | ගැලනිගම | (පානදුර - නම්බපාන - රත්නපුර මාර්ගය) | (A008) | 08 - 09 |
| IV. | දොඩන්ගොඩ | (නාගොඩ - කළුවැල්ලාව - බැල්ලපිටිය මාර්ගය) | (B304) | 10 - 11 |
| v. | වැලිපැන්න | (හොරණ - අඟුරුවාතොට - අලුත්ගම මාර්ගය) | (B157) | 12 - 13 |
| VI. | කුරුඳුගහහැතැක්ම | (අම්බලන්ගොඩ - ඇල්පිටිය - පිටිගල මාර්ගය) | (B014) | 14 - 15 |
| VII. | බද්දේගම | (හික්කඩුව - බද්දේගම - නිල්හේන මාර්ගය) | (B153) | 16 - 17 |
| VIII. | පින්නදූව | (ගාල්ල - උඩුගම මාර්ගය) | (B129) | 18 - 19 |
| IX. | ඉමදූව | (ගාල්ල -දෙනියාය- මාදම්පේ මාර්ගය) | (A017) | 20 - 21 |
| X. | කොක්මාදූව | (වැලිගම - කනංකේ මාර්ගය) | (B465) | 22 - 23 |
| XI. | ගොඩගම | (මාතර - අකුරැස්ස මාර්ගය) | (A024) | 24 - 25 |

4. ප්‍රවේශවීමට අවසර දෙන හා නොදෙන වාහන 26
5. ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය හා ගාස්තු 27
6. පළමුවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් 28
7. දෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් 29
8. තෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් 30
9. සිව්වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් 31
10. අධිවේගී මාර්ගය භාවිතය සඳහා උපදෙස් 32 - 33
11. අධිවේගී මාර්ගයට ඇතුළුවීම 34
12. අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම හා මාර්ගයෙන් පිටවීම 35
13. හදිසි අවස්ථාවන්හිදී ගතයුතු ක්‍රියාමාර්ග 36
14. අධිවේගී මාර්ගය භාවිතයේදී වැදගත්වන තවත් කරුණු 37
15. අන්තර් හුවමාරුවල සිට කඩිනමින් ළඟාවිය හැකි රෝහල් 38
16. අන්තර් හුවමාරුවලට ආසන්න පොලිස් ස්ථානවල තොරතුරු 39
17. සේවා ප්‍රදේශයේදී ලැබිය හැකි පහසුකම් 40
18. දක්ෂිණ අධිවේගී මාර්ගයේ එක් එක් අන්තර් හුවමාරු අතර ඇති දුර ප්‍රමාණයන් 41
19. ගාල්ල සිට අධිවේගී මාර්ගයට පිවිසෙන අයුරු 42
20. මාතර සිට අධිවේගී මාර්ගයට පිවිසෙන අයුරු 43
21. කඩුවෙල, පෑලියගොඩ හා ආසන්න නගරවල සිට අධිවේගී මාර්ගයට පිවිසෙන ආකාරය 44



දක්ෂිණ අධිවේගී මාර්ගය - කුරුඳුගහහැතැක්ම ප්‍රදේශය

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# 01. හැඳින්වීම

රටක සංවර්ධනයට වැදගත් වන්නාවූ යටිතල පහසුකම් අතුරින් මාර්ග සංවර්ධනය ඉතා සුවිශේෂ ස්ථානයක් ගනී. මුහුදුබඩ මාර්ගය (A002) ඔස්සේ කොළඹ සිට මාතර දක්වා වූ කි.මී. 160 ක දුර ප්‍රමාණයකින් යුත් පැය 5 කට අධික ධාවන කාලයක් ගතවන අධික තදබදයකින් යුත් මාර්ගය වෙනුවට අලුතින් නිමවූ කි.මී. 126 ක් පමණ දුර ප්‍රමාණයකින් යුත් දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි ධාවනය කිරීමට ගතවන කාලය පැය 1 1/2 කි. පළමු අදියරේ දී මහජනතාවට විවෘත වූයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට පින්නදූව දක්වා වූ කි.මී 95.3 ක කොටස හා කි.මී 5.2 ක් වන පින්නදූව සිට ගාල්ල දක්වා වන ගාලු වරාය ප්‍රවේශ මාර්ගය (B594) පමණි.පින්නදූව සිට මාතර (ගොඩගම) දක්වා කොටස (කි.මී 30.8 )දෙවන අදියර ලෙස මහජනතාවට විවෘත වේ.

මෙම අධිවේගී මාර්ගයෙහි ගමන් කිරීම මගී ජනතාවට ඉමහත් පහසුවක් බව නොකිවමනාය. සියලුම වාහන ඒකාකාරී වේග රටාවක් තුළ ධාවනය වීම හේතුවෙන් ඉන්ධන පිරිමැස්ම ද, ටයර් සහ තිරිංග ක්‍ෂයවීම් අඩුවීම ද වාහන හිමිකරුවන්ට මහත් අස්වැසිල්ලක් ගෙන දෙයි. බාධාවන්ගෙන් තොරව ධාවනය කිරීමට හැකිවීම තුළ රියදුරන්ගේ ආතතිය මෙන්ම මහන්සිය ද අඩුවේ. විරුද්ධ දිශාවන්ට බාධාවකින් තොරව ධාවනය කිරීමට පහසුවන පරිදි අධිවේගී මාර්ගය හරි මැදින් වෙන්කර තිබීම, ත්‍රීරෝද රථ, බයිසිකල්, ට්‍රැක්ටර් ආදී සෙමින් ධාවනය වන වාහන ධාවනයට ඉඩනොදීම, අධික බර පැටවූ වාහන වලට ඇතුළුවීමට ඉඩනොදීම මෙන්ම පදිකයින්ට ගමන් කිරීමට අවසර නොදීම යන කරුණු මෙම මාර්ගයේ කඩිනම් ආරක්ෂාකාරී ධාවනය තහවුරු කරයි.

# දක්ෂිණ අධිවේගී මාර්ගය (E01)





හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# I. කොට්ටාව අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 0.0)

ප්‍රවේශ පත්‍ර කවුළු

ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
කහතුඩුව (කි.මී 5.9)


හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# කොට්ටාව අන්තර් හුවමාරුව

**කොළඹ - රත්නපුර-වැල්ලවාය-මඩකළපුව මාර්ගයේ (A004) කොට්ටාව හා හෝමාගම නගර අතර පිහිටා ඇත.**

- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 138 - හෝමාගම - පිටකොටුව
  - ❖ මාර්ග අංක 122 - අවිස්සාවේල්ල - පිටකොටුව හා රත්නපුර - කොළඹ
  - ❖ මාර්ග අංක 124 - මීපේ - මහරගම
  - ❖ මාර්ග අංක 125 - පාදුක්ක - පිටකොටුව හා ඉංගිරිය - පිටකොටුව
  - ❖ මාර්ග අංක 99 - බදුල්ල - කොළඹ





කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න


- **කොට්ටාව අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ හෝමාගම පොලිස් ස්ථානය
  - ❖ ශ්‍රී ජයවර්ධනපුර ශික්ෂණ රෝහල
  - ❖ මහරගම ජාතික තරුණ සේවා සභාව
  - ❖ හෝමාගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනය
  - ❖ අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස සංකීර්ණ
  - ❖ හෝමාගම මූලික රෝහල
  - ❖ මහරගම පිළිකා රෝහල
  - ❖ පනාගොඩ යුධ හමුදා කඳවුර
  - ❖ මත්තේගොඩ හා රුක්මල්ගම නිවාස සංකීර්ණ



# II. කහතුඩුව අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 5.9)

ප්‍රවේශ පත්‍ර කවුළු

ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
කොට්ටාව (කි.මී. 5.9)

ඊළඟ අන්තර් හුවමාරුව
ගැලනිගම (කි.මී. 7.8)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# කහතුඩුව අන්තර් හුවමාරුව


කොළඹ - හොරණ මාර්ගයේ (B084) පොල්ගස්ඕවිට හා ගෝනපොල නගර අතර පිහිටා ඇත.



- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 120 - හොරණ - කොළඹ
  - ❖ මාර්ග අංක 120 - හොරණ - පිලියන්දල
- **කහතුඩුව අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ කහතුඩුව පොලිස් ස්ථානය
  - ❖ හොරණ මූලික රෝහල
  - ❖ වෑතර මූලික රෝහල

# III. ගැලනිගම අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 13.7)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
කහතුඩුව (කි.මී. 7.8)

ඊළඟ අන්තර් හුවමාරුව
දොඩන්ගොඩ (කි.මී. 21.1)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න


# ගැලනිගම අන්තර් හුවමාරුව

පානදුර - රත්නපුර මාර්ගයේ (A 008) බණ්ඩාරගම හා හොරණ නගර අතර පිහිටා ඇත.

- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 450 - පානදුර - රත්නපුර හා පානදුර - හොරණ
- **ගැලනිගම අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ බණ්ඩාරගම පොලිස් ස්ථානය
  - ❖ බණ්ඩාරගම දිසා රෝහල
  - ❖ හොරණ මූලික රෝහල
  - ❖ පානදුර ශ්‍රී සුමංගල පිරිමි / බාලිකා විදුහල්
  - ❖ හොරණ ශ්‍රීපාලි සෞන්දර්ය ආයතනය
  - ❖ හොරණ ශ්‍රීපාලි / තක්ෂිලා විදුහල්
  - ❖ කළුතර බෝධිය



# IV.දොඩන්ගොඩ අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 34.8)




හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# දොඩන්ගොඩ අන්තර් හුවමාරුව

නාගොඩ - මතුගම මාර්ගයේ (B 304) එකී නගර දෙකට මැදිව පිහිටා ඇත.


- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ✳ මාර්ග අංක 430 - මතුගම - කොළඹ
  - ✳ මාර්ග අංක 430/1 - කළුතර - මතුගම



- **දොඩන්ගොඩ අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන**
  - ✳ දොඩන්ගොඩ පොලිස් ස්ථානය
  - ✳ කළුතර මහ රෝහල
  - ✳ කටුකුරුන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලය
  - ✳ කුකුළේගඟ ජල විදුලි බලාගාරය හා නිවාඩු නිකේතනය
  - ✳ කළුතර බෝධිය

# V. වැලිපැන්න අන්තර් හුවමාරුවේ දළ සැලැස්ම (කි.මී. 46.0)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
දොඩන්ගොඩ (කි.මී.11.2)

ඊළඟ අන්තර් හුවමාරුව
කුරුඳුගහහැතැක්ම (කි.මී.21.6)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# වැලිපැන්න අන්තර් හුවමාරුව

**අලුත්ගම - මතුගම මාර්ගයේ (B 157) ලෙව්වන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත.**


- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 441 - අලුත්ගම - මතුගම



- **අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ වැලිපැන්න පොලිස් ස්ථානය
  - ❖ මතුගම දිසා රෝහල
  - ❖ බෙන්තොට සංචාරක කලාපය
  - ❖ බෙන්තර ගලපාත රජමහා විහාරය

## VI. කුරුඳුගහහැතැක්ම අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 67.6)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල





ඊළඟ අන්තර් හුවමාරුව
වැලිපැන්න (කි.මී 21.6)

ඊළඟ අන්තර් හුවමාරුව
බද්දේගම (කි.මී 12.2)

# කුරුඳුගහහැතැක්ම අන්තර් හුවමාරුව


අම්බලන්ගොඩ - ඇල්පිටිය මාර්ගයේ (B 014) ඇල්පිටිය හා කරන්දෙණිය නගර අතර පිහිටා ඇත.

- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❋ මාර්ග අංක 996 - අම්බලන්ගොඩ - ඇල්පිටිය
- **අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන**
  - ❋ ඇල්පිටිය පොලිස් ස්ථානය
  - ❋ ඇල්පිටිය දිසා රෝහල
  - ❋ බලපිටිය මූලික රෝහල
  - ❋ අම්බලන්ගොඩ ධර්මාශෝක / දේවානන්ද විදුහල්



# VII. බද්දේගම අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 79.8)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
කුරුඳුගහහැතැක්ම (කි.මී 12.2)

ඊළඟ අන්තර් හුවමාරුව
පින්නදූව (කි.මී 15.5)

# බද්දේගම අන්තර් හුවමාරුව

හික්කඩුව - බද්දේගම - නිල්හේන මාර්ගයේ (B 153) නයාපාමුල ප්‍රදේශයේ පිහිටා ඇත.


- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❋ මාර්ග අංක 378/2 - බද්දේගම - උඩුගම
  - ❋ මාර්ග අංක 370 - ගාල්ල - බද්දේගම



- **අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන**
  - ❋ බද්දේගම පොලිස් ස්ථානය
  - ❋ බද්දේගම දිසා රෝහල
  - ❋ කරාපිටිය ශික්ෂණ රෝහල
  - ❋ හික්කඩුව සංචාරක කලාපය

# VIII. පින්නදූව අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 95.3)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
බද්දේගම (කි.මී. 15.5)

ඊළඟ අන්තර් හුවමාරුව
ඉමදූව (කි.මී 12.2)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# පින්නදූව අන්තර් හුවමාරුව


ගාල්ල - උඩුගම මාර්ගයේ (B 129) පිහිටා ඇත.



- අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්
    - ❖ මාර්ග අංක 377 - ගාල්ල - උඩුගම
- අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන
    - ❖ ගාල්ල පොලිස් ස්ථානය
    - ❖ කරාපිටිය ශික්ෂණ රෝහල
    - ❖ ගාලු වරාය
    - ❖ උනවටුන වෙරළ තීරය
    - ❖ ගාලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය

# IX. ඉමදූව අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 107.5)

ප්‍රවේශ පත්‍ර කවුළු
ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
පින්නදූව (කි.මී 12.2)

ඊළඟ අන්තර් හුවමාරුව
කොක්මාදූව (කි.මී 7.7)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# ඉමදූව අන්තර් හුවමාරුව

**ගාල්ල දෙනියාය මාදම්පේ මාර්ගයේ (AA017) පිහිටා ඇත.**




- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 375/2 - ගාල්ල - අකුරැස්ස
- **අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ ඉමදූව දිසා රෝහල
  - ❖ මඩොල් දූව
  - ❖ අහංගම සංචාරක කලාපය
  - ❖ කොග්ගල නිදහස් වෙළඳ කලාපය
  - ❖ කොග්ගල අභ්‍යන්තර ගුවන් තොටුපල

# X. කොක්මාදුව අන්තර් හුවමාරුවේ දළ සැලැස්ම (කි.මී. 115.2)

ප්‍රවේශ පත්‍ර කවුළු

ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
ඉමදූව (කි.මී 7.7 )

ඊළඟ අන්තර් හුවමාරුව
ගොඩගම(කි.මී 10.9)

හදිසි ඇමතුම් අංකය
**1969**

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# කොක්මාදුව අන්තර් හුවමාරුව

වැලිගම කනංකේ මාර්ගයේ (B 465) පිහිටා ඇත.




- අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්
    - ❖ මාර්ග අංක 370 - වැලිගම - ඉමදූව
- අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන
    - ❖ වැලිගම පොලිස් ස්ථානය
    - ❖ වැලිගම කුෂ්ඨ රාජ ගල
    - ❖ වැලිගම/ මිරිස්ස සංචාරක කලාපය
    - ❖ මිරිස්ස ධීවර වරාය

# XI. ගොඩගම අන්තර් හුවමාරුවේ දල සැලැස්ම (කි.මී. 126.1)

ප්‍රවේශ පත්‍ර කවුළු

ආසන්නතම රෝහල




ඊළඟ අන්තර් හුවමාරුව
**කොක්මාදුව (කි.මී. 10.9)**

හදිසි ඇමතුම් අංකය
**1969**

# ගොඩගම අන්තර් හුවමාරුව

**මාතර අකුරැස්ස මාර්ගයේ (A024) පිහිටා ඇත.**



- **අන්තර් හුවමාරුව ආසන්නයෙන් ධාවනය වන ප්‍රධාන බස් සේවාවන්**
  - ❖ මාර්ග අංක 360/1 - මාතර අකුරැස්ස
- **අවට පිහිටා තිබෙන ප්‍රධාන ආයතන/ ස්ථාන**
  - ❖ රුහුණ විශ්ව විද්‍යාලය
  - ❖ මාතර මහ රෝහල
  - ❖ උයන්වත්ත ක්‍රීඩාංගනය
  - ❖ පැරණි ඕලන්ද තාරකා කොටුව
  - ❖ මාතර පැරණි ඕලන්ද කොටුව

## 04. ප්‍රවේශවීමට අවසර දෙන හා නොදෙන වාහන

**ධාවනය සඳහා අවසර නොමැති වාහන,**

- පාපැදි, ට්‍රැක්ටර්, ත්‍රී රෝද රථ, මෝටර් බයිසිකල්
- නියමිත බරට වඩා අධික බර පටවාගත් වාහන
- මෝටර් වාහන පනතෙහි සඳහන් නියමිත ප්‍රමාණයට වඩා උසින්, දිගින් හා පළලින් වැඩි වාහන
- ගර්හිත එන්ජින්/ටයර් හා දුමාරය සහිත වාහන

**ධාවනය සඳහා සුදුසුකම් ලබන වාහනවල,**

- තිරිංග හා සුක්කානම් පද්ධතිය හොඳ තත්ත්වයේ පැවතීම,
- සංඥා හා ලාම්පු හොඳින් ක්‍රියාකිරීම,
- ආසන පටි, පැති කණ්ණාඩි නියමිත ආකාරයට තිබීම,
- වේග මීටර් ඇතුළු අදාළ මීටර් ක්‍රියා කිරීම,
- ටයර්වල වායු පීඩනය නියමිත ප්‍රමාණයට පැවතීම, **කි.මී. 100 ක වේගයෙන් ආරක්ෂිතව ධාවනය කිරීමට හැකිවීම ඉතා වැදගත්ය.**

**පදිකයින්ට අධිවේගී මාර්ගයට ඇතුළුවීමට හෝ ගමන් කිරීමට අවසර දෙනු නොලැබේ.**

## 05. ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය හා ගාස්තු

- ඕනෑම අන්තර් හුවමාරුවකින් ඇතුළුවන වාහනයකට, ඇතුළු වූ ස්ථානය හා වාහනයේ වර්ගය සඳහන් ටිකට්පතක් නිකුත් කරනු ලැබේ.
- අධිවේගී මාර්ගයෙන් පිටවන අවස්ථාවේදී ඇතුළුවන විට ලබාදුන් ටිකට්පත ඉදිරිපත් කළ යුතු අතර එවිට ගෙවිය යුතු ගාස්තුව තීරණය කෙරේ.
- නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු රිසිට්පතක් නිකුත් කරනු ඇත.
- මෙසේ අයකරනු ලබන මුදල් මාර්ග නඩත්තුව, හදිසි ආපදා සේවාවන් සහ අතුරු වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා යොදවනු ලැබේ.
- දැනට ගාස්තු අයකිරීම මුදල් භාවිතයෙන් පමණක් සිදුකෙරේ.


# 06. පළමුවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රුපියල් වලින්)


6km 8km 21km 11km 22km 12km 16km 12km 8km 10km

| | කොට්ටාව | කහතුඩුව | ගැලනිගම | දොඩන්ගොඩ | වැලිපැන්න | කුරුඳුගහහැතැක්ම | බද්දේගම | පින්නදූව | ඉමදූව | කොක්මාදූව | ගොඩගම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොට්ටාව | | | | | | | | | | | |
| කහතුඩුව | 100 | | | | | | | | | | |
| ගැලනිගම | 150 | 100 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 200 | 150 | 150 | | | | | | | | |
| වැලිපැන්න | 250 | 200 | 200 | 100 | | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 300 | 250 | 250 | 150 | 150 | | | | | | |
| බද්දේගම | 350 | 300 | 250 | 200 | 200 | 100 | | | | | |
| පින්නදූව | 400 | 350 | 300 | 250 | 250 | 150 | 150 | | | | |
| ඉමදූව | 450 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 100 | | | |
| කොක්මාදූව | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | | |
| ගොඩගම | 550 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | |

අන්තර් හුවමාරු අතර දුර ප්‍රමාණයන්

### වාහන වර්ග

| කාර් | |
|---|---|
|  | සියලුම කාර් |
|  | සියලුම ජීප් |
|  | සියලු සැලූන් ස්ටේෂන් වැගන් |

| ද්විත්ව කාර්යය වාහන | |
|---|---|
|  | සියලුම කැබ්රථ (තනි හා ද්විත්ව) |
|  | ආසන 09ක් දක්වා වූ සියලු මගී වෑන් රථ |
|  | දළ බර කිලෝ ග්‍රෑම් 3500 දක්වා වූ බඩු ප්‍රවාහන වෑන් සහ ට්‍රක් රථ |

හදිසි ඇමතුම් අංකය
1969

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# 07. දෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රුපියල් වලින්)

අන්තර් හුවමාරු අතර දුර ප්‍රමාණයන්

6km 8km 21km 11km 22km 12km 16km 12km 8km 10km

| | කොට්ටාව | කහතුඩුව | ගැලනිගම | දොඩන්ගොඩ | වැලිපැන්න | කුරුඳුගහහැතැක්ම | බද්දේගම | පින්නදූව | ඉමදූව | කොක්මාදූව | ගොඩගම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොට්ටාව | | | | | | | | | | | |
| කහතුඩුව | 200 | | | | | | | | | | |
| ගැලනිගම | 200 | 200 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 400 | 300 | 250 | | | | | | | | |
| වැලිපැන්න | 400 | 350 | 300 | 200 | | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 600 | 500 | 400 | 300 | 250 | | | | | | |
| බද්දේගම | 600 | 600 | 500 | 350 | 300 | 200 | | | | | |
| පින්නදූව | 700 | 700 | 600 | 450 | 400 | 250 | 200 | | | | |
| ඉමදූව | 900 | 850 | 800 | 650 | 550 | 400 | 300 | 150 | | | |
| කොක්මාදූව | 950 | 900 | 850 | 700 | 600 | 450 | 350 | 200 | 150 | | |
| ගොඩගම | 1050 | 1000 | 950 | 800 | 700 | 500 | 400 | 300 | 200 | 150 | |

වාහන වර්ග

| සැහැල්ලු මෝටර් කෝච් | |
|---|---|
| | ආසන 09 ට වැඩි මඟී ප්‍රවාහන වෑන් රථ |
| | ආසන 09ත් 33ත් අතර සියලු බස් රථ |

හදිසි ඇමතුම් අංකය
1969

කඩිනම්, ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුකව ධාවනය කරන්න

# 08. තෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රුපියල් වලින්)

අන්තර් හුවමාරු අතර දුර ප්‍රමාණයන්: 6km 8km 21km 11km 22km 12km 16km 12km 8km 10km

| | කොට්ටාව | කහතුඩුව | ගැලනිගම | දොඩන්ගොඩ | වැලිපැන්න | කුරුඳුගහහැතැක්ම | බද්දේගම | පින්නදූව | ඉමදූව | කොක්මාදූව | ගොඩගම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොට්ටාව | | | | | | | | | | | |
| කහතුඩුව | 250 | | | | | | | | | | |
| ගැලනිගම | 250 | 250 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 500 | 450 | 300 | | | | | | | | |
| වැලිපැන්න | 600 | 550 | 450 | 250 | | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 900 | 800 | 700 | 500 | 300 | | | | | | |
| බද්දේගම | 1000 | 950 | 850 | 600 | 450 | 250 | | | | | |
| පින්නදූව | 1300 | 1200 | 1100 | 800 | 650 | 350 | 250 | | | | |
| ඉමදූව | 1350 | 1300 | 1200 | 950 | 800 | 550 | 400 | 250 | | | |
| කොක්මාදූව | 1450 | 1350 | 1250 | 1000 | 850 | 600 | 450 | 300 | 250 | | |
| ගොඩගම | 1600 | 1500 | 1400 | 1150 | 1000 | 750 | 600 | 400 | 300 | 250 | |


## වාහන වර්ග

**මෝටර් කෝච්**




ආසන 33 ට වැඩි සියලු බස් රථ

**සැහැල්ලු මෝටර් ලොරි**



ඇක්සල් 02ක් හා රෝද 06ක් සහිත ලොරි සහ ට්‍රක් රථ

**මෝටර් ලොරි**



ඇක්සල් 03ක් සහිත මෝටර් ලොරි සහ ට්‍රක් රථ
(දළ බර කිලෝ ග්‍රෑම් 17000 ට වැඩි)


# 09. සිව්වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රුපියල් වලින්)

අන්තර් හුවමාරු අතර දුර ප්‍රමාණයන්: 6km 8km 21km 11km 22km 12km 16km 12km 8km 10km

| | කොට්ටාව | කහතුඩුව | ගැලනිගම | දොඩන්ගොඩ | වැලිපැන්න | කුරුදුගහහැතැක්ම | බද්දේගම | පින්නදූව | ඉමදූව | කොක්මාදූව | ගොඩගම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොට්ටාව | | | | | | | | | | | |
| කහතුඩුව | 300 | | | | | | | | | | |
| ගැලනිගම | 300 | 300 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 700 | 500 | 400 | | | | | | | | |
| වැලිපැන්න | 900 | 700 | 600 | 300 | | | | | | | |
| කුරුදුගහහැතැක්ම | 1300 | 1100 | 1000 | 600 | 400 | | | | | | |
| බද්දේගම | 1600 | 1400 | 1200 | 800 | 600 | 300 | | | | | |
| පින්නදූව | 1700 | 1500 | 1400 | 1200 | 800 | 500 | 300 | | | | |
| ඉමදූව | 1800 | 1600 | 1500 | 1100 | 1000 | 650 | 450 | 300 | | | |
| කොක්මාදූව | 1900 | 1700 | 1600 | 1200 | 1100 | 750 | 550 | 350 | 300 | | |
| ගොඩගම | 2000 | 1800 | 1700 | 1400 | 1200 | 1000 | 750 | 550 | 400 | 300 | |


**වාහන වර්ග**

**බර මෝටර් කෝච්**



එකට ඈඳූ මෝටර් කෝච් දෙකක් සහිත බස්

**බර මෝටර් ලොරි**



ඇක්සල් 04ක් හෝ ඊට වැඩි සියලු රථ

# 10. අධිවේගී මාර්ගය භාවිතය සඳහා උපදෙස්

- අධිවේගී මාර්ගවල අනතුරු ප්‍රමාණය ඉතා අවම තත්ත්වයක පවත්වාගෙන යාම මාර්ගයේ කාර්යක්ෂම භාවිතය සඳහා ඉතා වැදගත් වේ.
- අධිවේගී මාර්ගයේ වාහන ධාවනය පැයට කි.මී. 100 ක වේගයකින් සිදුවන බැවින් හදිසි අනතුරකදී මගීන්ට හා වාහනවලට සිදුවන අලාභය සාමාන්‍ය මාර්ග අනතුරකදී සිදුවන අලාභයට වඩා වැඩිවේ.
- වාහන දෙකක සුළු ගැටීමක්, හදිසි නැවතීමක්, U හැරවීමක්, මාර්ග පැති බැම්මක හෝ වැටක ගැටීමක් වාහන විශාල සංඛ්‍යාවක ගැටීමකට හේතු විය හැකිය.
- අධිවේගී මාර්ගයක සිදුවන වාහන අනතුරකදී අනතුරට භාජනය වූ වාහනය ඉවත් කිරීමට ගතවන කාලය සාමාන්‍ය මාර්ගයට වඩා වැඩි බැවින් එහිදී සිදුවන වාහන තදබදය හා පමාව සාමාන්‍ය මාර්ගයකට වඩා වැඩිය.
- අධිවේගී මාර්ගයෙහි ධාවනය කරන අනෙකුත් වාහන වලට බාධාවක් නොවන පරිදි මාර්ග නීති රීතීන්ට අනුව ආරක්ෂාකාරීව ධාවනය කිරීම ඉතා වැදගත් වේ.
- කිසිදුවිටකදී බීමතින්, නිදිමතින් හෝ අධික මහන්සියෙන් යුතුව වාහන ධාවනය නොකල යුතුය.

## අධිවේගී මාර්ගය භාවිතය සඳහා උපදෙස්.............

- මංතීරු මත හදිසියේ වාහනය නතර කිරීම, පසුපසට ධාවනය කිරීම හෝ U හැරවීමක් මඟින් ප්‍රතිවිරුද්ධ දිශාවට වාහනය ධාවනය කිරීම නොකල යුතුය.
- මංතීරු මාරුකිරීම ආරම්භ කිරීමට පෙර සංඥා ලාම්පු දල්වා අනෙකුත් වාහන වලට බාධා නොවන ආකාරයෙන් මංතීරු මාරුකල යුතුය.

  අධිවේගී මාර්ගයේ දී හදිසි අවස්ථාවක දී හැර වාහන නතර කිරීමට අවසර දෙනු නොලැබේ.
- ඉතාම හදිසි අවස්ථාවක දී, හදිසි සංඥා ලාම්පු දල්වා, හදිසි මංතීරුවේ හැකි පමණ වම්පසට වනසේ නැවැත්විය හැකිය.
- අධිවේගී මාර්ගයේ හදිසි මංතීරුවේ පළල මීටර් 1.75 ක් බැවින් එම මංතීරුව තුළ වාහනය නවතා දොර විවෘත කිරීම අනෙකුත් ධාවනය වන වාහන වලට බාධාවක් විය හැකිය. එබැවින් හැකිතරම් දුරට වාහනය තුල රැඳී සිට ඔබ පසුකල මාර්ග සලකුණු පුවරුවකින් හෝ ඔබ සිටින තැන සිට දැකගත හැකි මාර්ග සලකුණු පුවරුවකින් ඔබ සිටින ස්ථානය පිළිබඳ තහවුරු කරගෙන ඔබගේ අවශ්‍යතාවය දුරකථනයක් මගින් අංක **1969** ට දන්වන්න.
- ඔබට වාහනයෙන් බැසීමට අත්‍යවශ්‍ය නම් පිටත මංතීරුවේ ධාවනය වන වාහන වලට බාධාවක් නොවන පරිදි දොර විවෘත කර වාහනයෙන් බැස හදිසි මංතීරුවේ පමණක් රැඳී සිටිය යුතුය.
- අපරීක්ෂාකාරී ලෙස දොර විවෘත කිරීම බරපතල අනතුරකට හේතු විය හැකිය.

## 11. අධිවේගී මාර්ගයට ඇතුළුවීම

- ගමන ආරම්භයට පෙර අධිවේගී මාර්ගයට ඇතුළුවන සහ පිටවන ස්ථාන නිවැරදිව තීරණය කලයුතුය. මේ සඳහා අධිවේගී මාර්ග සිතියම භාවිතා කරන්න.
- ගමනාන්තය දක්වා ප්‍රමාණවත් ඉන්ධන වාහනයේ තිබේදැයි පරීක්ෂාකාරී වන්න.
- සංඥා පුවරුවල සඳහන් විස්තර නියමාකාරයෙන් පිළිපැද ධාවනය කල යුතු දිශාවට අයත් නිසි පිවිසුම් මාර්ගයට ඇතුළු වීම ඉතා වැදගත් කාර්යයකි.
- ඇතුල්වීමේ දී කවුන්ටරයෙන් ලබාදුන් ටිකට්පත සුරැකිව තබාගත යුතු අතර එය මාර්ගයෙන් පිටවීමේ දී ඉදිරිපත් කලයුතුය.
- පිවිසුම් මාර්ගයේ දී වාහනය ආපසු හැරවීම හෝ පසුපසට ධාවනය කිරීම කිසිසේත් නොකල යුතුය.
- පිටත මංතීරුවේ ගමන් කරන වාහන අතර පරතරය අවශ්‍ය ප්‍රමාණයක තිබේ නම්, එම වාහනවල වේගයට සමාන වේගයක් පවත්වා ගනිමින්, දැනටමත් මාර්ගයේ ගමන් කරන වාහනවලට අවහිරයක් නොවන පරිදි, පිටත මංතීරුවට ප්‍රවේශවන්න.
- ඔබගේ වාහනය අධිවේගී මාර්ගයට ඇතුල්කිරීමේ දී දැනටමත් අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහන අතර අවශ්‍ය පරතරය නොතිබෙන බව හැඟී ගියහොත් ඔබගේ වාහනය නතර කිරීමට සිදුවන බැවින් ඒ පිළිබඳව කල්පනාකාරී වන්න.
- එවැනි අවස්ථාවක දී ඉතා පරිස්සමෙන් අධිවේගී මාර්ගයේ වාහන නොඑන අවස්ථාවක් බලා, අධිවේගී මාර්ගයට වාහනය ඇතුල් කළ යුතුය.
- වාහනයක් අධිවේගී මාර්ගයට ඇතුලත් කිරීමේ දී අනතුරක් සිදුවුවහොත් වාහනය අධිවේගී මාර්ගයට ඇතුල් කරන රියදුරු අනතුරට වගකිව යුතුවේ.

## 12. අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම

- අධිවේගී මාර්ගයේ මංතිරු සහ සලකුණු නිවැරදිව පිළිපැදිය යුතු අතර සාමාන්‍ය ධාවනයේ දී පිටත මංතීරුව භාවිතා කලයුතුය. වාහනයක් පසුකර යාම සඳහා පමණක් ඇතුලත මංතීරුව භාවිතා කල හැකිය.
- මංතීරු මාරු කිරීමේ දී අනිකුත් වාහනවල ධාවනයට අවහිර නොවන පරිදි එය සිදුකල යුතුයි.
- මංතීරු මාරු කිරීමේ දී අනතුරක් සිදුවුවහොත් සෑමවිටම මංතීරු මාරුකළ රියදුරු අනතුරට වැරදිකරු වේ.
- හදිසි අවස්ථාවක දී හැර අනෙකුත් කිසිදු අවස්ථාවක දී අධිවේගී මාර්ගය තුල වාහනය නතර කල නොහැකිය.
- ඉහළ වේගයක් පවත්වා ගෙන යාම ඉතා වැදගත් වන අතර උපරිම වේගය පැයට කිලෝ මීටර් 100 වේ. සෑමවිටම ඉදිරිපස වාහනය සමඟ හොඳ පරතරයක් තබාගත යුතුය.
- අයහපත් කාලගුණික තත්ත්වයන්හි දී සහ රාත්‍රී ධාවනයේ දී අවස්ථානුකූලව වේගය පාලනය කරගන්න.

## අධිවේගී මාර්ගයෙන් පිටවීම

- අන්තර් හුවමාරුවෙන් පිටවන වාහන, අන්තර් හුවමාරුවට මීටර 500 දැක්වෙන සංඥා පුවරුව පසුකරන විට පිටත මංතීරුවේ තිබිය යුතු අතර පිටත මං තීරුවේ සිට වාහන හැරවීමේ විදුලි සංඥා දල්වා අනෙකුත් වාහන වලට අවහිරයක් නොවන පරිදි පිටවන මංතීරුවට මාරු විය යුතුය.
- වැරදීමකින් පිටවන මාර්ගය මගහැරී ඉදිරියට ගියහොත්, වාහනය පිටුපසට ධාවනය කිරීම, ආපසු හැරවීම හෝ අධිවේගී මාර්ගයට ඇතුළුවන මාර්ගයට හැරවීමෙන්, වාහනය ගමන් කරන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කිරීම නොකල යුතුය.
- ඔබට පිටවන මාර්ගය මග හැරුනොත් ඉදිරියට ධාවනය කර ඊලඟ අන්තර් හුවමාරුවෙන් ආපසු පැමිණිය යුතුය.

# 13. හදිසි අවස්ථාවක දී ගතයුතු ක්‍රියාමාර්ග

- අධිවේගී මාර්ගයේ ධාවනය කිරීමේදි වාහනයේ දෝෂයක් හෝ ආපදාවක් සිදුවුවහොත්, වාහනයේ අනතුරු සංඥා දල්වා, ධාවනය වන වාහනවලට බාධාවක් නොවන පරිදි හදිසි නැවතුම් තීරුවට ගෙන අයින් කර නවතා ගත යුතුය.
- ඔබ පසුකළ මාර්ග සලකුණු පුවරු ඇසුරෙන් ඔබ නවතා සිටින ස්ථානය සහ ඔබගේ අවශ්‍යතාවය, දුරකථනයකින් ටිකට් පතෙහි සඳහන් 1969 අංකයට දන්වන්න. විනාඩි කීපයක් තුළදී අවශ්‍ය සේවාවන් ඔබ වෙත ලඟා වනු ඇත.
- හැකි තරම් දුරට වාහනය තුළම රැඳී සිටිය යුතු අතර, වාහනයෙන් බැසීම අත්‍යවශ්‍ය නම්, පිටත මංතීරුවේ ධාවනය වන වාහනවලට බාධාවක් නොවන පරිදි දොර විවෘත කර, වාහනයෙන් බැස හදිසි මංතීරුවේ පමණක් රැඳී සිටිය යුතුය.
- අපරීක්ෂාකාරී ලෙස හදිසියේ දොර විවෘත කිරීම බරපතල අනතුරකට හේතුවිය හැකිය.
- කිසිවිටකත් ඔබ ධාවන මං තීරු දිගේ ඇවිද නොයා යුතුය. අනතුරු සංඥා දල්වා තිබීම අත්‍යවශ්‍ය වන අතර පැය 24 පුරාම පොලීසිය, හදිසි ආපදා රථ හා ගිලන් රථ සේවා ඔබගේ සේවය සඳහා සුදානමින් පවති.

## 14. අධිවේගී මාර්ගය භාවිතයේ දී වැදගත්වන තවත් කරුණු කිහිපයක් ............

1. වාහනය ධාවනය වන අතරතුර අප ද්‍රව්‍ය හෝ වෙනත් කිසිදු ද්‍රව්‍යයක් වාහනයෙන් පිටතට විසි නොකරන්න. එසේ විසිකිරීම මගින් අධික වේගයෙන් ධාවනය වන වාහනවලට, මාර්ගයට හෝ වෙනත් අයෙකුට හානි සිදුවිය හැකිය.
2. වාහනයේ ගමන්ගන්නා මගීන් කිසිවකුත්, කිසිදු අවස්ථාවක දී ජනෙල් විවෘත කොට තම හිස, අත්, පා ආදිය ජනෙල්වලින් පිටතට දැමීමෙන් වැළකිය යුතුය.
3. රියදුරු හා ඉදිරිපස ආසනවල ගමන් ගන්නා මගීන් හා කුඩා ළමුන්ද ඇතුළුව, සියලුම මගීන් නිසිලෙස ආසන පටි පැළඳීම කළ යුතුය.
4. ප්‍රවේශ පත්‍ර කවුළුවේ දී ගෙවීමට අවශ්‍ය කරන මුදල් කලින්ම සුදානම් කර ගැනීමෙන් ඔබගේ හා අන් අයගේ කාලය ඉතිරි කර ගන්න.
5. වාහනය පැදවීමේ දී ජංගම දුරකථන භාවිතය තහනම් වන බැවින්, රියදුරු එසේ කිරීමෙන් වළකින්න. එසේ ඇමතීමට අවශ්‍ය නම්, අනිවාර්යයෙන්ම ඔබගේ වාහනයේ ගමන් ගන්නා වෙනත් අයකුගේ සහය ලබා ගන්න.
6. කිසියම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් අධිවේගී මාර්ගයේ නීතී රීතී උල්ලංඝනය කරමින් හැසිරෙනු, එහි දේපලවලට හානි කරනු හෝ සොරකම් කරනු දුටුවහොත් වහාම අදාළ සිදුවීම පිළිබඳව හදිසි ඇමතුම් අංකයට (1969) දැනුම් දෙන්න.
7. හදිසි අවස්ථාවක දී හෝ අනතුරක දී, ධාවනය වන අනෙකුත් වාහනවල සහය ලබා ගැනීමෙන් වැළකී, හදිසි ඇමතුම් අංකය (1969) ඇමතීම මගින් අධිවේගී මාර්ගයේ නිලධාරීන්ගේ සේවය ලබා ගන්න.
8. ඔබ කිසියම් අනතුරක් දුටුවහොත් ඒ බව හදිසි දුරකථන ඇමතුම් අංකයට (1969) දැනුම් දෙන්න. එවන් අවස්ථාවක දී ඔබගේ වාහනය ධාවනයට බාධාවක් නොමැති නම් නතර කිරීමෙන් වළකින්න.
9. වඩාත් කාර්යක්ෂම හා ආරක්ෂාකාරී ගමනක් සඳහා නීතිගරුක වන්න.

# 15. අන්තර් හුවමාරුවල සිට කඩිනමින් ලඟා විය හැකි රෝහල්

| | අන්තර් හුවමාරුව | අන්තර් හුවමාරුවේ සිට කඩිනමින් ලඟා විය හැකි රෝහල<br>C - බරපතල අනතුරකදී යා යුතු රෝහල<br>M - සුළු අනතුරකදී යා යුතු රෝහල | | දුරකථන අංකය |
|---|---|---|---|---|
| 01. | කොට්ටාව | ශ්‍රී ජයවර්ධනපුර ශික්‍ෂණ රෝහල | (C,M) | 011 277 8610/ 19 |
| | | හෝමාගම මූලික රෝහල | (C,M) | 011 285 5200 |
| 02. | කහතුඩුව | වෑතර මූලික රෝහල | (C,M) | 011 270 4277 |
| 03. | ගැලනිගම | බණ්ඩාරගම දිසා රෝහල | (M) | 038 229 0261 |
| | | පානදුර මූලික රෝහල | (C,M) | 038 223 2261/ 038 223 1986 |
| | | හොරණ මූලික රෝහල | (C,M) | 034 226 2379/ 034 226 1261 |
| 04. | දොඩන්ගොඩ | කළුතර මහ රෝහල | (C,M) | 034 222 2262 |
| 05. | වැලිපැන්න | මතුගම දිසා රෝහල | (M) | 034 224 7261 |
| 06. | කුරුඳුගහහැතැක්ම | බලපිටිය මූලික රෝහල | (C,M) | 091 225 8261 |
| | | ඇල්පිටිය මූලික රෝහල | (C,M) | 091 229 1260/ 61 |
| 07. | බද්දේගම | බද්දේගම දිසා රෝහල | (M) | 091 229 2261 |
| 08. | පින්නදූව | කරාපිටිය ශික්ෂණ රෝහල | (C,M) | 091 223 2267/ 091 223 2176 |
| | | මහමෝදර ශික්ෂණ රෝහල | (C,M) | 091 222 2261/ 091 223 4951 |
| 09. | ඉමදූව | ඉමදූව දිසා රෝහල | (M) | 0912286061 |
| 10. | කොක්මාදූව | වැලිගම දිසා රෝහල | (M) | 0412250261 |
| 11. | ගොඩගම | මාතර මහ රෝහල | (C,M) | 0412227821 |


## 16. අන්තර් හුවමාරුවලට ආසන්න පොලිස් ස්ථානවල තොරතුරු

| | අන්තර් හුවමාරුව | පොලිස් ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 01. | කොට්ටාව | කොට්ටාව පොලිස් ස්ථානය | 011 2782760 |
| | | හෝමාගම පොලිස් ස්ථානය | 011 2855222 |
| 02. | කහතුඩුව | කහතුඩුව පොලිස් ස්ථානය | 011 2705233 |
| 03. | ගැලනිගම | බණ්ඩාරගම පොලිස් ස්ථානය | 038 2290222 |
| 04. | දොඩන්ගොඩ | දොඩන්ගොඩ පොලිස් ස්ථානය | 034 2281622 |
| 05. | වැලිපැන්න | වැලිපැන්න පොලිස් ස්ථානය | 034 2274423 |
| 06. | කුරුඳුගහහැතැක්ම | ඇල්පිටිය පොලිස් ස්ථානය | 091 2291222 |
| 07. | බද්දේගම | බද්දේගම පොලිස් ස්ථානය | 091 2292222 |
| 08. | පින්නදුව | ගාල්ල පොලිස් ස්ථානය | 091 2222222 |
| 09. | ඉමදූව | ඉමදූව පොලිස් මුරපොල | 091-3090222 |
| | | අහංගම පොලිස් ස්ථානය | 091-2283222 |
| 10. | කොක්මාදූව | වැලිගම පොලිස් ස්ථානය | 041-2250222 |
| 11. | ගොඩගම | මාතර පොලිස් ස්ථානය | 041-2222222-3 |

# 17. සේවා ප්‍රදේශවල දී ලැබිය හැකි පහසුකම්

- අධිවේගී මාර්ගයේ දොඩන්ගොඩ හා වැලිපැන්න අන්තර් හුවමාරු අතර (කි.මී. 44) වම්පස සහ දකුණු පස විවේක ස්ථාන සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත.
- ඒවායේ ආපන ශාලා, වැසිකිළි පහසුකම් සහ විවේකය සඳහා පහසුකම් ඇත.






ඊළඟ අන්තර් හුවමාරුව
දොඩංගොඩ (කි.මී.9)


ඊළඟ අන්තර් හුවමාරුව
වැලිපැන්න (කි.මී.2)

## 18 . දක්ෂිණ අධිවේගී මාර්ගයේ එක් එක් අන්තර් හුවමාරු අතර ඇති දුර ප්‍රමාණයන් (කි.මී)

| | කොට්ටාව | කහතුඩුව | ගැලනිගම | දොඩංගොඩ | වැලිපැන්න | කුරුඳුගහහැතැක්ම | බද්දේගම | පින්නදූව | ඉමදූව | කොක්මාදූව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාකුඹුර | | | | | | | | | | |
| කහතඩුව | 5.9 | | | | | | | | | |
| ගැලනිගම | 13.7 | 7.8 | | | | | | | | |
| දොඩංගොඩ | 34.8 | 28.9 | 21.1 | | | | | | | |
| වැලිපැන්න | 46.0 | 40.1 | 32.3 | 11.2 | | | | | | |
| කුරුඳුගහහැතැක්ම | 67.6 | 61.7 | 53.9 | 32.8 | 21.6 | | | | | |
| බද්දේගම | 79.8 | 73.9 | 66.1 | 45.0 | 33.8 | 12.2 | | | | |
| පින්නදූව | 95.3 | 89.4 | 81.6 | 60.5 | 49.3 | 27.7 | 15.5 | | | |
| ඉමදූව | 107.5 | 101.6 | 93.8 | 72.7 | 61.5 | 39.9 | 27.7 | 12.2 | | |
| කොක්මාදූව | 115.2 | 109.3 | 101.5 | 80.4 | 69.2 | 47.6 | 35.4 | 19.9 | 7.7 | |
| ගොඩගම | 126.1 | 120.2 | 112.4 | 91.3 | 80.1 | 58.5 | 46.3 | 30.8 | 18.6 | 10.9 |


## 19. ගාල්ලේ සිට අධිවේගී මාර්ගයට පිවිසෙන අයුරු

- ගාල්ලේ සිට **A002** මාර්ගයේ පැමිණෙන වාහන ගාල්ල නගරයට පසුව හමුවන කි.මී.120 කණුව පසුකර, වමට හැරී ගාලු පිවිසුම් මාර්ගයේ කි.මී. 5.2 ක් ගමන්කර පින්නදූව හුවමාරුව වෙත පැමිණිය යුතුය.



## 20. මාතර සිට අධිවේගී මාර්ගයට පිවිසෙන අයුරු

- මාතර බස් නැවතුමේ සිට ගාල්ල දෙසට කි.මී. 2.1 ක් ගමන්කර නූපේ හන්දියෙන් දකුණට හැරී අකුරැස්ස දෙසට කි.මී. 4 ක් ගමන් කල පසු ගොඩගම හුවමාරුව වෙත පැමිණිය හැක.



## 21. කඩුවෙල, පෑලියගොඩ හා ආසන්න නගරවල සිට අධිවේගී මාර්ගයට පිවිසෙන ආකාරය

කඩුවෙල → මාලබේ → අරංගල ↘

පෑලියගොඩ → බොරැල්ල → බත්තරමුල්ල ↗

පන්නිපිටිය → කොට්ටාව → කොට්ටාව අන්තර් හුවමාරුව

දක්ෂිණ අධිවේගී මාර්ගය තුළ රථවාහන නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂිත පොලිස් සේවා
වක් ස්ථාපිත කර ඇත.

ඔබගේ වාහනය CCTV කැමරා පද්ධතියක් මගින් නිරන්තර අධීක්ෂණයට ලක් වනු ඇත.

සටහන්

# දක්ෂිණ අධිවේගී මාර්ගය

| | | | |
|---|---|---|---|
| A004 | කොළඹ | (කි.මී. 0+000) කොට්ටාව | රත්නපුර |
| B084 | කොළඹ | (කි.මී. 5+930) කහතුඩුව | හොරණ |
| A008 | පානදුර | (කි.මී. 13+675) ගැලනිගම | හොරණ |
| B304 | නාගොඩ | (කි.මී. 34+787) දොඩන්ගොඩ | මතුගම |
| B157 | අලුත්ගම | (කි.මී. 46+000) වැලිපැන්න | මතුගම |
| B014 | අම්බලන්ගොඩ | (කි.මී. 67+575) කුරුඳුගහහැතැක්ම | ඇල්පිටිය |
| B153 | හික්කඩුව | (කි.මී. 79+775) බද්දේගම | නිල්හේන |
| B129 | | | |
| B594 | ගාල්ල (ගා.ව.පු.මා) | (කි.මී. 95+275) පින්නදූව | උඩුගම |
| A017 | අහංගම<br>වැලිගම | (කි.මී. 107+500) ඉමදූව | අකුරැස්ස |
| B465 | මාතර | (කි.මී. 115+200) කොක්මාදූව | කනංකේ |
| A024 | | (කි.මී. 126+100) ගොඩගම | අකුරැස්ස |

E01

Printed by Madhawee Printers (Pvt) Ltd.

මාර්ග සංවර්ධන අධිකාරිය